www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඇලන් තෝර්නට් විසින් ට්‍රොට්ස්කිවාදය හෙලාදැකීම

## පලමුවන කොටස

**Alan Thornett's denunciation of Trotskyism**

**ක්‍රිස් මාස්ඩන් විසිනි**

**2008 මාර්තු 20**

*මෙහි පලවන්නේ, බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝර්ජ් ගැලෝවේ විසින් මෙහෙයවන ලද ගෞරවය යලි පිහිටුවීමේ හෙවත් රෙස්පෙක්ට් රිනීවල් ව්‍යාපෘතිය තුල ඇලන් තෝර්නට්ගේ ජාත්‍යන්තර සමාජවාදී කන්ඩායමේ භූමිකාව විශ්ලේෂනය කෙරන කොටස් දෙකකින් යුත් ලිපියෙහි පලමුවැනි කොටස ය. මෙහි දෙවැනි කොටස හෙට පලවේ.*

"ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතවාදය හා පුලුල් වාම පක්ෂ" යන හිසින් යුතු සමාජවාදී ප්‍රතිරෝධයේ මෙහෙයුම් කමිටුව විසින් නිකුත් කරන ලද ප්‍රකාශයක් ඉන්ටර්නැෂනල් වීව්පොයින්ට් සඟරාවේ ජනවාරි සංස්කරනයෙහි පල කර තිබේ. ජාත්‍යන්තර සමාජවාදී කන්ඩායම යන නමින් ද හැඳින්වෙන මෙහි නායකත්වය දරන්නේ ඇලන් තෝර්නට් ය.

රෙස්පෙක්ට් රිනීවල්හි පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝර්ජ් ගැලෝවේගේ ප්‍රධාන උපදේශක වශයෙන් තම තත්වය තෝර්නට් මෑතක දී සුරක්ෂිත කර ගත්තේ ය. රෙස්පෙක්ට් රිනීවල් යනු පසු ගිය නොවැම්බරයේ බ්‍රිතාන්‍ය සමාජවාදී කම්කරු පක්ෂය (එස්ඩබ්ලිව්පී) සමග ගැලෝවේ බේද වීමෙන් පසු පිහිටුවා ගන්නා ලද සංවිධානයකි.

ඉරාක යුද්ධය අවසන් වූ ඉක්බිත්තේ පිහිටුවා ගන්නා ලද සමගි-සන්ධානයක් වන රෙස්පෙක්ට් රිනීවල් පිහිටුවීමේ ගාමක බලවේගය වූයේ එස්ඩබ්ලිව්පීයයි. යුද විරෝධී කම්කරු පාක්ෂික මන්ත්‍රීවරුන්, වෘත්තීය සමිති නිලධාරීන්, ස්ටැලින්වාදීන්, හරිතයන් (ග්‍රීන්), ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීන් හා යුද්ධය නවත්වනු සන්ධානය අටවා ගත් මුස්ලිම් කන්ඩායම්වලින් ද සැදුම් ලත් සන්ධානයේ දේශපාලන ව්‍යාප්තියක් ලෙස ය එස්ඩබ්ලිව්පීය රෙස්පෙක්ට් සංවිධානය පරිකල්පනය කලේ.

එවැනි සන්ධානයකට මැතිවරනයකදී කම්කරු පක්ෂයට සාර්ථක ලෙස අභියෝග කල හැකි වනු ඇතැයි එස්ඩබ්ලිව්පීය ගනන් බැලීය. එසේ කල හැක්කේ එවැනි යලි කන්ඩායම් ගැසීමකට බාධක නොපමුනුවන්නේ නම් පමනි. ලොකුම බාධකය වනුයේ නව පක්ෂය නිශ්චිතව ම සමාජවාදී යයි අවධාරනය කිරීම තුලිනි. එමනිසා එස්ඩබ්ලිව්පීය ප්‍රකාශ කර සිටියේ රෙස්පෙක්ට් රිනීවල් සංවිධානය "පුලුල් සන්ධානයක්" වනු ඇති බවයි. එය තුල සමාජවාදීන් සිටින අතර ඉස්මතු කරනුයේ එයට බැඳුනු සියලු යුද විරෝධී බලවේගයන්ට එකඟවිය හැකි ඉල්ලීම් පමනි.

රෙස්පෙක්ට් සංවිධානයෙහි "සමාජවාදී" කොටස එස්ඩබ්ලිව්පීයෙන් ම සමන්විත වනු ඇත. ඊට අමතරව, ඊටත් වැදගත් ලෙස, ඉරාක යුද්ධයෙහි ප්‍රතිඵලයක් වශයෙන් හා බ්ලෙයාර්ගේ ව්‍යාපාරවලට පක්ෂපාතී ප්‍රතිපත්තිවලට විරුද්ධවීම හේතු කොට ගෙන බ්ලෙයාර් ආන්ඩුවෙන් බිඳී වෙන්වේ යයි අපේක්ෂා කල වාම කම්කරු පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගෙන් හා වෘත්තීය සමිති නිලධාරින්ගෙනි. මේ විරෝධය ගැන කම්කරු පාක්ෂිකයින් රෙස්පෙක්ට් සංවිධානයෙහි සැබෑ නායකත්වය සපයනු ඇත.

ඒ අනුව එස්ඩබ්ලිව්පීය හැරුනේ යුද්ධයට එරෙහි සංවිධානය වූ ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන් හා තරුනයන් කෙරේ නොව, යුද විරෝධී ව්‍යාපාරයේ ආධිපත්‍යය දැරීමට සමත්වීම තුලින් බ්ලෙයාර් ආන්ඩුවට එරෙහිව කිසිදු දේශපාලන සටනක නොයෙදීමට සහතික වූ දේශපාලන බලවේගයන් කෙරේ ය.

එහි විරුද්ධ පන්ති බලවේග තුල මුල් බැසගත් පුලුල් ලෙස එකිනෙකට ප්‍රතිවිරුද්ධ දේශපාලන ප්‍රවනතා මත පදනම් වූ ද, "ආන්ඩුවේ අධිපතිවාදී" සමාජ ප්‍රතිපත්ති හා ලාභ කේන්ද්‍රීය, නව ලිබරල් ආර්ථික මූලෝපායන් හේතුවෙන් ගැඹුරින්ම කලකිරී සිටීම හැර වෙනත් වැඩ පිලිවෙලකට එකඟත්වයක් නොමැති වූ ද, මෙවැනි පක්ෂයකට කුමන කොන්දේසි යටතේ වත් පැවැත්මක් නොමැත. කම්කරු පාක්ෂිකයින් සැලකිය යුතු ස්තරයක් එම පක්ෂයෙන් කැඩී ඒම සිදු නොවූ නිසා රෙස්පෙක්ට් සංවිධානයෙහි ඉරනම දෙගුනයකින් දුර්භාග්‍යසම්පන්න විය. ඉරාක යුද්ධය දිගටම ගෙන යන තතු තුල, එයට පාර්ලිමේන්තු මන්ත්‍රීන් අතලොස්සක් විසින් දැක්වූ සංකේතාත්මක විරෝධය පවා වාෂ්ප වී ගියේ ය. කම්කරු පක්ෂය තුල සිය සැපපහසුකම් සහිත වෘත්තීය පැවැත්ම පරිත්‍යාග කිරීමට ඉන් කිසිවෙක් සූදානම් නොවී ය.

යුද්ධයට විරුද්ධවීම හේතු කොට ගෙන කම්කරු පක්ෂයෙන් පහකරන ලද ගැලෝවේ පමනක් ඉන් ඉවතට වැටුනි. යලි පාර්ලිමේන්තුවේ අසුනක්

දිනා ගැනීම සඳහා රෙස්පෙක්ට් සංවිධානය මූලික වශයෙන් ගැලෝවේ ට මාධ්‍යයක් විය.

තවද ඉමාම්වරුන්, මුස්ලිම් ව්‍යාපාරිකයන්, සුලුධනේශ්වර නායකයින් හා බ්‍රිතාන්‍යයේ මුස්ලිම් සංගමය වැනි කන්ඩායම් වෙත ගැලෝවේගේ නැඹුරුව ද, මැද පෙරදිග තන්ත්‍රයන් කෙරේ ඔහුගේ අනුගත වීම ද ඇරඹුනේ යුද විරෝධී ව්‍යාපාර කාල පරිච්ඡේදය තුල ගැලෝවේ මත විශ්වාසය තැබීම එස්ඩබ්ලිව්පීයේ මේ අනුගතවීම වඩාත් ගැඹුරු කලේ ය. එස්ඩබ්ලිව්පීය එසේ කලේ මැතිවරනවල දී සිය ඉදිරි පිම් තැබීම සඳහා ගැලෝවේගේ සම්බන්ධතා ප්‍රයෝජනයට ගැනීමේ අපේක්ෂාවෙනි.

මේ සැලසුම එස්ඩබ්ලිව්පීයට ඉතාමත් අයහපත් අන්දමට ආපසු කැරකී ආවේ ය. එස්ඩබ්ලිව්පීය සමග සන්ධානයට මුස්ලිම් දේශපාලනඥයන් හා ව්‍යාපාරිකයින් සිය එදිරිවාදිකම පැහැදිලිව පෙන්වීමත් සමග ගැලෝවේ අවසානයේ දී පෙර තම සහකරුවන්ට එරෙහිව ක්‍රියාත්මක විය. යම්තාක් දුරකට කොමියුනිස්ට් විරෝධය විසින් ද, වැඩි වශයෙන් පටු සංවිධානාත්මක ප්‍රතිවාදිත්වය විසින් ද, නායකත්වයේ සිටින හා අපේක්ෂකයින් වන අයවලුන් මත එස්ඩබ්ලිව්පීයට අප්‍රමාන බලපෑමක් ඇති බවට පැවති විශ්වාසයක් තුලින් ද, මේ විරෝධය පොලඹවන ලදී.

රෙස්පෙක්ට් සංවිධානයෙහි ඉතිරිව සිටි නාමික වාම කන්ඩායම තෝර්නට්ගේ කුඩා සහායක කන්ඩායමයි. ගැලෝවේගේ මුස්ලිම් ආධිපත්‍යයෙන් යුතු කල්ලිය, එස්ඩබ්ලිව්පීයේ ප්‍රජාතන්ත්‍රවිරෝධී භාවිතයන්ට එරෙහිවූ මහා ප්‍රතිසංස්කරන ව්‍යාපාරයක් වශයෙන් තෝර්නට් හුවා දැක්වී ය. රෙස්පෙක්ට් "යලි පිහිටුවීමේ" අවස්ථාව ලබාගැනීමට ඔහු යුහුසුලු විය. පක්ෂයේ මුද්‍රනාලය පවා ඔහු එයට භාරදුනි.

## විප්ලවකාරී සමාජවාදය වෙත ප්‍රහාරයක්

ඉන්ටර්නැෂනල් වීව්පොයින්ට් සඟරාවෙහි තෝර්නට්ගේ ප්‍රවනතාවය විසින් පල කරන ලද ලිපිය සකස් කර ඇත්තේ එස්ඩබ්ලිව්පීයට එරෙහිව විවාදශීලී එකක් ලෙස ය. රෙස්පෙක්ට් සංවිධානයෙහි පදනම වශයෙන් මුලින් සිතූ පරිදි "ප්‍රගතිශීලී බලවේගයන්ගේ පුලුල් සන්ධානය" ගොඩ නැගීමේ අසාර්ථකත්වයට එස්ඩබ්ලිව්පීය වගකිව යුතු බව ඉන් ප්‍රකාශ වින. මේ ක්‍රියාවලිය තුල දී, පැරනි සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ස්ටැලින්වාදී සංවිධානවලින් දිරාපත්වන කැබලිවලින් හා වෙන් වී ගිය අයවලුන්ගෙන් නව පක්ෂ ගොඩනැගීමේ එවැනි සියලු උත්සාහයන් පසුපස ඇති නරුම, ප්‍රතිපත්ති විරහිත හා සමාජවාද විරෝධී දේශපාලනය සම්බන්ධයෙන් ඉතාමත් (රලු) අමිශ්‍රවූ ඉදිරිපත් කිරීමක් තෝර්නට් කරයි.

තෝර්නට් කතා කරන්නේ හතරවැනි ජාත්‍යන්තරයේ එක්සත් ලේකම් මන්ඩලයේ (යූ සෙක්) බ්‍රිතාන්‍ය අංශයේ නායකයා ලෙස ය. ප්‍රන්සයේ ලීග් කොමියුනිස්ට් රෙවලූෂනයාර් වැනි එයට සම්බන්ධ පක්ෂ ලොව පුරා එවැනි ම දේශපාලන වැයම්වල නිරතව සිටිත්. ට්‍රොට්ස්කිවාදය කෙරේ ඇති ගැඹුරු දේශපාලන එදිරිවාදිකමත්, සමාජවාදීන් හා ජාත්‍යන්තර ඉදිරි දර්ශනය විසින් මෙහෙයවනු ලබන කම්කරු පන්තිය සඳහා වන ස්වාධීන දේශපාලන නායකත්වයක් ගොඩනැගීමේ අත්‍යවශ්‍ය කර්තව්‍යය පිලිගැනීම ප්‍රතික්ෂෙප කිරීමත් එවැනි ව්‍යාපාරවල අත්‍යවශ්‍ය පදනම බව ඔහු ප්‍රදර්ශනය කරයි.

රෙස්පෙක්ට් සංවිධානය බිඳී යාම තුල "මූලෝපායික දේශපාලනයේ ප්‍රශ්න නොතිබූ" බැව් එම ප්‍රකාශය පිලිගනී. එනමුදු, එම බිඳී යාම වැදගත් බව ඉන් අවධාරනය කෙරේ. ජාත්‍යන්තර සමාජවාදී කන්ඩායම හෙවත් ඉන්ටර්නැෂනල් සෝෂලිස්ට් ගෲප් හා එක්සත් ලේකම් මන්ඩලය මෙන් නොව, "තමන් ට්‍රොට්ස්කිවාදීන් ලෙස හඳුන්වා ගන්නා ඇතැම් සංවිධාන විසින් අනුගමනය කරන දේශපාලනමය සංවිධානයට අදාල ආකෘතිවලට හා වමේ ඉතිරි කොටස් සමග එකට කටයුතු කිරීමේ පුරුදුවලට" එස්ඩබ්ලිව්පීය කැපවී ඇති නිසා රෙස්පෙක්ට් අසාර්ථක වූ බව තෝර්නට් ප්‍රකාශ කරයි. "තෙවැනි කාල වකවානුවේ ස්ටැලින්වාදය මගින් හා ස්ටැලින්වාදයට යටවූ කොමින්ටර්නයෙන් උරුම වූ සංවිධානාත්මක ක්‍රම" මගින් තමන් ට්‍රොට්ස්කිවාදීන් ලෙස හඳුන්වාගත් සංවිධාන වෙත අතිමහත් පීඩනයක් එල්ල කෙරුනි. " බ්‍රිතාන්‍ය ට්‍රොට්ස්කිවාදයේ කිසිම කන්ඩායමකට මේ පීඩනයෙන් පූර්න වශයෙන් ගැලවී සිටීමට නොහැකිවී ය" යි ඔහු තවදුරටත් කියා සිටී. [1]

බ්‍රිතාන්‍යයේ අනිකුත් වාම කන්ඩායම් ඓතිහාසිකවම පැරනි පොදු ජන කම්කරු පක්ෂ කෙරේ අධිවාම ආකල්පයක් හා ස්ටැලින්වාදී සංවිධානාත්මක ප්‍රවේශයක් අනුගමනය කල බවට තෝර්නට් චෝදනා කරයි. 1990 ගනන්වල අගභාගයේ සිට පිහිටුවන ලද නව "පුලුල් වාම" පක්ෂ සම්බන්ධයෙන් එම වැරැද්ද නොකල යුතු බව අවධාරනය කිරීමට මේ චෝදනාව අවස්ථාවක් සපයයි. ඉතාලියේ රිෆොන්ඩසියෝන් කොමියුනිස්ටා වැනි සංවිධාන ද, වඩාත් මෑත දී, ජර්මනියේ වාම පක්ෂ ද, ස්වාධීන මාක්ස්වාදී පක්ෂයක් ගොඩනැගීමේ මුවාවෙන් අනවශ්‍ය හා භේදකාරී උත්සාහයක නිරතව සිටි වාමාංශයේ යලි ඉපදීමක් ලෙස ඔහු උනුසුම්ව පිලිගනී.

"1902 වසරේදී හෝ 1917 වසරේ දී බවා රුසියාවේ දී ලියන ලද පාඨ එරෙහම පිටින්ම ගෙන 2007 වසරේදී කෙලින්ම යොදාගැනීම කල හැක්කකියි පරිකල්පනය කිරීම විකාර රූපී" ප්‍රකාශයෙහි සඳහන් වේ. "1934 වසරෙහි මිනියාපොලිස්වලට[2] අදාල විප්ලවකාරී සංවිධානයක හා දේශපාලනයක ආකෘතියක් ගෙන එය සරලව හාත්පසින් ම වෙනස් වූ

තත්වයකට බහා ලෑම" ඊටත්වඩා විශ්වාසනීයත්වයෙන් හීනවූවකැයි ඔහු සඳහන් කරයි. වෙනස්වූ තත්වය තුල කේන්ද්‍රීය නව ගැටලු (විශේෂයෙන්, ලිංගභේදය හා පරිසරය) මගින් විප්ලවකාරී දේශපාලනය පරිවර්තනයට ලක් කොට ඇත. සංස්කෘතික මට්ටම, භූගෝලීය ව්‍යාප්තිය හා දේශපාලන හා වෘත්තීය සමිති සංවිධානය අතින් ගත් කල කම්කරු පන්තියට මේ තත්වය තුල පරිවර්තනයට ලක් කොට ඇත. පොදුජන සමාජ ව්‍යාපාරවල අත්දැකීම හා ස්ටැලින්වාදයේ (හා සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ) ශේෂ පත්‍රය මේ තත්වය තුල විප්ලවකාරී ව්‍යාපාරයේ හරි මැද ඇති ස්වයංසංවිධානයේ හා ප්‍රජාතන්ත්‍රවාදයේ කේන්ද්‍රීය ස්වභාවය මූලික වශයෙන් යලි තහවුරු කොට ඇත.

ලෙනින්ගේ කෘතිවල අවිවේචනාත්මක භාවිතයට එරෙහිව තෝර්නට් තර්ක නොකරයි. කම්කරු පන්තිය මත පදනම්වූ සමාජවාදී පක්ෂයක් ගොඩනැගීමේ ඕනෑම හැකියාවක් ඔහු ප්‍රතික්ෂේප කරයි. අනාගතය රැඳී ඇත්තේ නව "පුලුල් වාම" හැඩගැසීම් තුලට දියවී යාම මත ය. (දියකරහැරීම මතය.)

ඔහු හුවාදක්වන පක්ෂ සම්බන්ධයෙන් ම කම්කරුවන් දැනටමත් වේදනාකාරී අත්දැකීම් ලබා ඇති බවට පිලිගැනීමට ඔහුට බලකෙරේ. නිදසුන් වශයෙන් "ඇෆ්ඝනිස්තාන යුද්ධයෙහි ඉතාලි සහභාගිත්වයට රිෆොන්ඩෙසියොන් කොමියුනිස්ටාව සහාය දීම" හා බ්‍රසීලයෙහි ලූලාගේ කම්කරු පක්ෂයේ "නව ලිබරල්වාදී දේශීය ප්‍රතිපත්තිවලට" සහාය දීම දැක්විය හැකිය. මේවා "සත්තකින්ම වාමාංශය ලත් දැවැන්ත පරාජයන්" බව ඔහු කියා සිටී. එනමුදු මේ පාවාදීම්වලට විරෝධය දක්වන ඕනෑම අයෙකුට ඔහුගේ විසකුරු වදන් එල්ල වේ.

ඔහුගේ ලියවිල්ලෙහි මෙසේ අවධාරනය කෙරේ: "මෙයින් පෙනී යන්නේ පිරිසිදු දෑත් හා නොකැලැල් ධජය" සහිත ප්‍රවනතාවය ලෙස හැඳින්විය හැකි විප්ලවකාරී වමේ ඇතැමුන්ට දේශපාලන වශයෙන් යලි නිර්මානය කිරීමේ උත්සාහයන් කාලය කා දැමීමකි. ඔවුන්ට, තම සංවිධානය ගොඩ නගා, තම පුවත්පත අලෙවි කොට, තම රැස්වීම් පවත්වා, අන් සියල්ලන්ම විවේචනය කොට, තම නොකැලැල් ධජය අත තබා ගැනීම වඩා යහපති. අපගේ දැක්ම අනුව, මේ අතිශය සරල වූ 'පක්ෂය ගොඩනැගීමේ' විකල්පය තව දුරටත් ක්‍රියාත්මක කල නොහැක්කකි."

"පිරිසිදු දෑත් හා නොකැලැල් ධජය" සහිත ප්‍රවනතාවය මෙසේ නරුම ලෙස ඉවතට දැමීම වූ කලි, 1938 වසරේ සංක්‍රමනික වැඩපිලිවෙලෙහි අවසන් ඡේදවලට අදාල විය. මේ සංක්‍රමනික වැඩ පිලිවෙල වූ කලි හතරවන ජාත්‍යන්තරය පිහිටුවන අවස්ථාවේ දී සම්මත කර ගත් ලියවිල්ලයි.

ට්‍රොට්ස්කි හතරවැනි ජාත්‍යන්තරය ගොඩ නැගුවේ 1926 බ්‍රිතාන්‍යයේ මහා වැඩ වර්ජනය හා 1927 චීන විප්ලවය පරාජය වීමත්, අන් සියල්ලට ම වඩා ජර්මනියේ හිට්ලර්ගේ ජයග්‍රහනයත් ඇතුලුව ජාත්‍යන්තර කම්කරු පන්තිය ලෝක පරිමානව අත් විඳි ඓතිහාසික පරාජයන්ට දේශපාලනමය ප්‍රතිචාරයක් ලෙස ය. මෙම පරාජයන් අත් වූයේ ජෝසප් ස්ටැලින්ගේ නායකත්වය යටතේ තිබූ සෝවියට් සංගමයෙහි හා ඊට අනුබද්ධිත කොමියුනිස්ට් (තුන්වැනි) ජාත්‍යන්තරයෙහි නිලධාරි පැලැන්තිමය පිරිහීමේ ප්‍රතිඵලයක් ලෙස ය.

තුන්වැනි ජාත්‍යන්තරයේ කිසිදු පක්ෂයක් මේ පාවාදීමට එරෙහිවීමට අසමත්වීම, විප්ලවකාරී සංවිධානයක් ලෙස එහි මරනය ප්‍රකාශ කිරීමටත් හතරවැනි ජාත්‍යන්තරය පිහිටු වීමටත් ට්‍රොට්ස්කිට මං පෑදී ය. ඔහු එසේ කලේ ස්පාඤ්ඤයෙහි පූමය වැනි මාධ්‍යමික පක්ෂවලට දේශපාලන වශයෙන් විරුද්ධ වීමෙනි. මේ පක්ෂ නව ජාත්‍යන්තරයක් පිහිටුවීමට විරුද්ධ වූහ. ඔවුන් ස්ටැලින්වාදීන්ට දේශපාලන වශයෙන් අභියෝග කිරීමට ප්‍රතික්ෂේප කිරීම තවත් ලේ වැකි පරාජයන්ට මං පෑදී ය. ට්‍රොට්ස්කිගේ අභියෝගයට ස්ටැලින්වාදී නිලධරයේ ප්‍රතිචාරය වූයේ 1930 ගනන්වල දේශපාලන විරේකකිරීම් දියත් කිරීම ය. මෙය අවසන් වූයේ අපකීර්තිමත් මොස්කව් නඩු විභාගවලිනි.

මේ පසුබිමට එරෙහිව හා දෙවැනි ලෝක සංග්‍රාමයේ අබියසදී, හතරවැනි ජාත්‍යන්තරය පිහිටුවන ලදී. මේ බිහිසුනු අත්දැකීම් උකහා ගනිමින්, ට්‍රොට්ස්කි මෙසේ ලිවීය. "මානව සංස්කෘතියෙහි වර්තමාන අර්බුදය වූ කලි නිර්ධන පන්ති නායකත්වයෙහි අර්බුදයයි. හතරවැනි ජාත්‍යන්තරය තුල එක්රැස්වී සිටින දියුනු කම්කරුවෝ මේ අර්බුදයෙන් ගොඩ එන මාර්ගය සිය පන්තියට පෙන්වා දෙති. විමුක්තිය උදෙසා නිර්ධන පන්තියේ හා සියලු පීඩිතයින්ගේ අරගලයෙහි ජාත්‍යන්තර අත්දැකීම් මත පදනම්ව ඔවුහු වැඩ පිලිවෙලක් ඉදිරිපත් කරති. නොකැලැල් ධජයක් ඔවුහු ඔසවති."

හතරවැනි ජාත්‍යන්තරය ගොඩනැගීම සඳහා ට්‍රොට්ස්කිගේ අරගලය තෝර්නට් සම්පූර්නයෙන්ම ප්‍රතික්ෂේප කරයි. නූතන යුගයට එය අදාල නොවන බව ඔහු ප්‍රකාශ කරයි. කම්කරු ව්‍යාපාරයෙහි හා වමෙහි හැඩරුව පිලිබඳ ව්‍යාජ සංකල්පයට එරෙහිව ද, ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයෙහි ඇතැම් කොටස්වලට පොදු වූ, 1930 ගනන්වල ඉදිරිපත් කරන ලද මත වැරදි ලෙස අනුවර්තනය කර ගැනීමට එරෙහිව ද, ඔහු දොස් නගයි. මූලික වශයෙන් කම්කරු පන්තිය හා එහි වෘත්තීය සමිති, ප්‍රතිසංස්කරනවාදීන් (ස්ටැලින්වාදීන්), නොයෙක් ආකාරයේ මාධ්‍යමිකයින්, (ප්‍රතිසංස්කරනය හා විප්ලවය

අතර දෝලනය වන ප්‍රවනතාවන් ) හා විප්ලවකාරී මාක්ස්වාදීන් - හා ඇතැම්විට අරාජකවාදීන් - තත්වය අවුල් කරන සිද්ධාන්තයක් ලෙස මේ සිතියම දකී.

මේ ප්‍රකාශය තව දුරටත් මෙසේ කියා සිටී: " මේ ආකාරයේ චිත්‍රයන් මත පදනම් වෙමින් 'හතරවැනි ජාත්‍යන්තරය හැරුනු විට විප්ලවකාරී ප්‍රවනතාවක් ලෙස හැඳින්විය හැකි අන් කිසිවක් මේ පොලෝ තලය මත නැතැයි ට්‍රොට්ස්කිට 1938 වසරේ දී කිවහැකිව තිබුනි" මේ මතය කෙදිනක හෝ ක්‍රියාත්මක කල හැකි වී නම් ඒ අද දින නම් නොවේ."

"අද දින විප්ලවකාරී දේශපාලනය සම්බන්ධයෙන් 'බොල්ෂෙවික් වාදයේ සියුම් රතු ඉර යන සංකල්පනය ක්‍රියාත්මක නොවේ යැයි. මෙම ලියවිල්ල අවධාරනය කරයි. ඒ මන්ද? මේ මතය ක්‍රියාමාර්ගික එකඟතාවකට ප්‍රමුඛත්වය දෙයි. ඒ ඇතැම්විට ගුප්ත හෝ ද්වීතීය ප්‍රශ්න සම්බන්ධයෙනි. ඒ බිම් මට්ටමෙහි සංවිධානය හා පන්ති අරගලය පිලිබඳ යථාර්ථයන් සැලකිල්ලට නොගනිමිනි." (අවධාරනය අපගේ)

## පැබ්ලෝවාදී දියකරහැරීමේ සූත්‍රය

තෝර්නට්ට අනුව, ස්ටැලින්වාදය, ප්‍රතිසංස්කරනවාදය හා මාධ්‍යමිකවාදය ගැන කථා කිරීමට ඉඩ දිය නොහැක. මන්ද යත්, ඔහු ගොඩනගාලීමට උත්සුක වන පක්ෂ පිහිටුවිය හැක්කේ ද ඒවාට බලපෑමක් ඇති කල හැක්කේ ද මේ අපකීර්තිමක් ප්‍රවනතාවන්ගේ දේශපාලන වාර්තාව ගැන කම්කරු පන්තිය අඳුරේ තැබීමෙන් හා නව පක්ෂවල කොඳු නාරටිය සැකසෙන්නේ ඒ අපකීර්තිමත් ප්‍රවනතාවල ඉතිරි කැබලිවලින් යයි කම්කරු පන්තියට සැඟවීමෙන් වන නිසා ය.

ස්ටැලින්වාදයේ ඉතිහාසය ගැන හොඳින් දන්නා කිසිවෙක් ඇෆ්ගනිස්තාන යුද්ධයෙහි ඉතාලියේ සහභාගිත්වයට රිෆොන්ඩසියොන් කොමියුනිස්ටා පක්ෂය සහාය දීම ගැන පුදුමයට පත් නොවනු ඇත. එය එසේ කලේ ඉතාලි කොමියුනිස්ට් පක්ෂය තුලින්ම මතුව ආ වාම ප්‍රජාතන්ත්‍රවාදීන් සමග එකට පෙල ගැසී සිටිමින් රොමානෝ ප්‍රෝඩිගේ ආන්ඩුවෙහි සන්ධාන හවුල්කරුවෙකු ලෙස ය.

රිෆොන්ඩසියොන් කොමියුනිස්ටාව වාම ප්‍රජාතන්ත්‍රවාදීන්ට වාම විකල්පයක් ලෙස ක්‍රියා කරනු ඇතැයි නොයෙක් වාම කන්ඩායම් ප්‍රකාශ කර තිබුනි. නමුත්, ඉතාලි රජයෙහි ලෙබනනය තුල භූමිකාව ද, එය උතුරු ඉතාලියෙහි ඇමරිකානු හමුදා කඳවුරෙහි ව්‍යාප්තියට සහාය දීම හා පෙබරවාරියේ දී බලයෙන් පහවීමට මග පෑදූ දැඩි ජීවන තත්ව කප්පාදු පියවරයන් ක්‍රියාත්මක කිරීම ද නොසලකා රිෆොන්ඩසියොන් කොමියුනිස්ටාව ඉතාලි රජයට සහාය දීම දිගට ම ගෙන ගියේය.

ලූලාගේ ඊනියා කම්කරු පක්ෂය විසින් කම්කරුවන්ගේ ජීවන තත්වයන්ට එල්ල කරන ලද ප්‍රහාර සම්බන්ධයෙන් ද ට්‍රොට්ස්කිවාදය අභාවයට පත් වී ඇතැයි තෝර්නට් විසින් හුවාදක්වන ලද අනිකුත් ඕනෑම සැකැසීමක වාර්තාව සම්බන්ධයෙන් ද කිව හැක්කේ මෙයමයි. තෝර්නට්ගේ ඉලක්කය වනුයේ ජර්මානු වාම පක්ෂය වැනි සංවිධානවලට දේශපාලන පොදු සමාවක් සලසා ලීමය. එම පක්ෂය පිහිටුවන ලද්දේ ඔස්කාර් ලාෆොන්ටේන් හා නැගෙනහිර ජර්මනියේ කලින් සිටි ස්ටැලින්වාදීන් විසින් නායකත්වය දෙන ලද සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් ගේ කොටසක් විසිනි. බ්‍රිතාන්‍යයේ එස්ඩබ්ලිව්පීයේ සහෝදර පක්ෂය ද ඇතුලුව නොයෙක් ආකාරයේ "වාම" කන්ඩායම් මේ පක්ෂය තුලට දියකර හැර ඇත.

වැඩසටහනක් පිලිබඳ එකඟතාවය හෙලාදැකීමත් සමග "පුලුල් වාම" පක්ෂ තුල ක්‍රියාකල යුතු ආකාරය ගැන "පොදු මෙහෙයුම් නිර්නයක" ලේඛනයක් ද තෝර්නට් ඉදිරිපත් කරයි. මෙයින් ඉතාමත් ම වැදගත් කරුන වන්නේ "කිසිදු විප්ලවකාරී ධාරාවකට 'විනයගරුක උරෙන් උර ගැටී සිටින පිරිසකගේ ' මෙහෙයවීමේ සංකල්පයක් තිබිය නොහැකිය යන්න පිලිබඳව ඔහුගේ අවධාරනය යයි.... ඇතුලු වී වැඩ කොටසක් කිරීමේ ක්‍රියාවක හෝ නිලධාරිවාදී නායකත්වයකට එරෙහි සටනක අප නියැලී නොසිටිමු."

තෝර්නට්ගේ නියමයන්ගෙන් ඔහු ප්‍රසාදය දක්වන්නේ කුමන ආකාරයේ පක්ෂවලට දැයි කියැවෙන්නේ ද? වැඩ සටහනක් පිලිබඳ එකඟතාවකට අරගලයක් නොමැත්තේ ය යන්නෙහි අරුත වනුයේ මේ පක්ෂවල නායකයන්ගේ ධනේශ්වරයට පක්ෂපාතී වැඩසටහනට කිසිදු අභියෝගයක් එල්ල නොවනු ඇති බවයි. ඔහුගේ ප්‍රවනතාව වනුයේ "නිලධාරිවාදී නායකත්වයට එරෙහිව සටනක් නොකිරීමය." සිය සංවිධානය තුලම හෝ සිය සම චින්තකයින්ගෙන් ක්‍රියාත්මක වන පුලුල් පක්ෂය තුල හෝ (රෙස්පෙක්ට් රිනීවල් හෝ වෙනත් සැකසුමක්) තෝර්නට් කිසිදු දේශපාලන ක්‍රියාවක් සම්බන්ධයෙන් සිය වගකීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් කිව යුත්තේ ද මෙය ම ය. ඔහු හඬ නගන්නේ සාමාන්‍ය පාක්ෂිකයන් වෙනුවෙන් නොව, නායකත්වයක් වෙනුවෙනි. ඔහු එම නායකත්වයෙහි හොඳින් ස්ථාපිත වූ නියෝජිතයෙකි. සියල්ල සාකච්ඡාවට භාජන කල හැක. ඕනෑම අදහසක් දැරිය හැක. එනමුදු එසේ කල හැක්කේ සිය පක්ෂයේ නාමික වැඩසටහනත්, සිය සාමාජිකයන්ගේ වරමත්, නොසලකාහැරීමට නායකයන්ට ඇති අයිතියට කිසිදු බාධාවක් ඇති නොවන තාක් දුරට හා සිය අභිමතය පරිදි කටයුතු කිරීමට ඉඩ ලැබෙන තාක් පමනි.

ඇෆ්ගනිස්තාන යුද්ධයෙහි ඉතාලි සහභාගිත්වයට රිෆොන්ඩසියොන් කොමියුනිස්ටාවේ සහාය ලබා දීම සම්බන්ධයෙන් ද සිදු වූයේ එයයි. බ්‍රිතාන්‍යයේ රෙස්පෙක්ට් රිනිවල් සංවිධානයට කවරදාක හෝ සැලකිය යුතු සහායක් ලැබුන හොත් එයට ද අත්වන්නේ එම ඉරනම යි.

මෙයට සම්බන්ධ ලියවිල්ලක, තෝර්නට් කන්ඩායමේ ඩේවිඩ් පැකර් මෙය මොනවට පැහැදිලි කරයි. "වර්තමාන සන්දර්භය තුල රෙස්පෙක්ට් සංවිධානය විප්ලවකාරී වැඩ සටහනක් හෝ විප්ලවකාරී ආකෘතිවල සංවිධානයක් වෙනුවෙන් සටන් නොකල යුතු හා කර නොමැති," අන්දම ඔහු පැහැදිලිව කියා පායි.

තෝර්නට් කන්ඩායම හුවාදක්වන "නිදහස" ක්‍රියාවට නැංවෙන අන්දම ගැන ඔහු තවදුරටත් යටත් පිරිසෙයින් එක් නිදසුනක් දක්වයි. ඔහු මෙසේ ලියයි: "ගබ්සා කිරීම සම්බන්ධයෙන් අපගේ ඇත්ත ස්ථාවරය එය 'තෝරාගැනීමට ඇති ස්ත්‍රියකගේ අයිතිය' යැයි අප එකඟ වන බවට මට සැකයක් නැත. එනමුදු, මේ මතයට පක්ෂව අපගේ එකම පාර්ලිමේන්තු මන්ත්‍රී (ජෝර්ජ් ගැලොවේ) කතා නොකරයි. රෙස්පෙක්ට් හි අනිකුත් ඇතැම් බලවේග ද ඊට පක්ෂව කතා නොකරයි.... පැහැදිලිව ම, පිලිගත් රෝමානු කතෝලිකයෙකු වූ ගැලොවේගෙන් ස්ත්‍රියකගේ තෝරාගැනීමේ අයිතිය වෙනුවෙන් තර්ක කිරීමක් අපට බලාපොරොත්තු විය නොහැක."

ට්‍රොට්ස්කි විසින් කලින් නුදුටු වර්ධනයන්ගේ පෙලඹවීමකින් පහල වුනු අලුතින් සොයාගත් ප්‍රඥාවක් තෝර්නට් විසින් කිසිසේත් ඉදිරිපත් නොකෙරේ. ඒ වෙනුවට තෝර්නට් කරන්නේ පැරනි හා අපකීර්තියට පත් ප්‍රතිසංස්කරනවාදී හා ස්ටැලින්වාදී පක්ෂවලට එරෙහි අරගලයකට විරෝධය පෑම සඳහා කලින් ගොනු කර ගත් තර්ක හුදෙක් යලි පන ගැන්වීමයි.

ඔහු, එක්සත් ලේකම් මන්ඩලයේ හා එහි ආරම්භක න්‍යායාචාර්යවරුන් වූ මයිකල් පැබ්ලෝ හා අර්නස්ට් මැන්ඩල් සමග දීර්ග කාලයක් බද්ධ වූ දේශපාලනයේ උනුසුම් අධි-සංස්කරනයකි. [3]

ට්‍රොට්ස්කිවාදයට ඉටු කල හැකි ස්වාධීන භූමිකාවක් නැතැයි පශ්චාත් යුද සමය පුරාම පැබ්ලෝවාදී කන්ඩායම් අවධාරනය කර ඇත. සමාජවාදය සඳහා අරගලය ඉදිරියට ගෙනයනුයේ ඕනෑම රටක ඉස්මතුව පෙනෙන "පොදුජන කම්කරු පක්ෂ" තුලට විප්ලවකාරීන් ඇතුලුවීම තුලිනි. එම පක්ෂ ස්ටැලින්වාදී, ප්‍රතිසංස්කරනවාදී හෝ ජාතිකවාදී ඒවා විය හැක. සන්ධාන ගොඩනැගීම තුලින් හා ඒවායේ නායකයින් මත බලපෑම් ඇති කිරීමේ අපේක්ෂාවෙන් හිතවත් උපදෙස් දීම තුලින් ඔවුන් එම පක්ෂ සමාජවාදී දිශානතියක් වෙත යොමු කරනු ඇත.

තෝර්නට්ගේ ලියවිල්ලෙහි වදන්වල පූර්ව ලක්ෂන පහල කරමින් "අපගේ විප්ලවකාරී බලවේගයට වඩා විශාලවූ සවිඥානක විප්ලවකාරී බලවේග වඩාත් ඵලදායී විය හැකි අන්දමට යලි ඒකාබද්ධ වීමක් පැබ්ලෝ 1951 වසරේදී ඉල්ලා සිටියේ ය. "ඔවුන් සමග සම්මිශ්‍රනය වීම" තුලින් "මහා මාක්ස්වාදී විප්ලවකාරී පක්ෂ" අවසනදී නිර්මානය කිරීම ද ඔහු ඉල්ලා සිටියේ ය.

හතරවැනි ජාත්‍යන්තරයෙන් පරිබාහිරව, "විප්ලවකාරී ධාරාවක් යැයි ඇත්ත වශයෙන්ම හැඳින්විය හැකි එකද ධාරාවක් වත් මේ ග්‍රහලෝකය මත නොපවතී" යන ට්‍රොට්ස්කිගේ අවධාරනය පැබ්ලෝ අවඥාවෙන් යුතුව බැහැර කරයි. 1953 ඔක්තෝබරයේ දී ඔහු මෙසේ ලිවී ය: "වර්තමාන සංයුක්ත ඓතිහාසික තත්වයන් යටතේ, වැඩිවැඩියෙන්ම හීන සම්භාවිතාවක් ඇති මතය වනුයේ ප්‍රතිසංස්කරනවාදීන් හා ස්ටැලින්වාදීන් සම්බන්ධයෙන් කලකිරීමට පත්වූ පොදු ජනයා ඔවුන්ගේ සම්ප්‍රදායික පොදු ජන සංවිධානවලින් බිඳී වෙන්වී අපගේ වර්තමාන කේන්ද්‍ර වටා ධ්‍රැවීකරනය වනු ඇතැයි යන්නය. යට කී කේන්ද්‍ර, පිටතින් සිට, සුවිශේෂීව හා හරාත්මකව ස්වාධීන ස්වභාවයකින් ක්‍රියා කරත්."

මේ දියකරහැරීමේ ප්‍රවනතාවයට එරෙහි අරගලයක් තුලිනි 1953 වසරේදී හතරවැනි ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව පිහිටුවන ලද්දේ. එය පිහිටුවන අවස්ථාවේ එක්සත් ජනපද ට්‍රොට්ස්කිවාදී නායක ජේම්ස් පී කැනන් විසින් නිකුත් කරන ලද " ලෝක කම්කරු ව්‍යාපාරයට විවෘත ලිපියක්" යන හිසින් යුතු නිවේදනය මෙසේ ප්‍රකාශ කර සිටී ය: "අපගේ ජාත්‍යන්තර ව්‍යාපාරය තුල ඇති වර්තමාන අර්බුදයෙහි මූලයන් ඇත්තේ ස්ටැලින්වාදයේ ස්වභාවය හා පක්ෂය පිලිබඳ ලෙනින්-ට්‍රොට්ස්කි න්‍යාය සම්බන්ධයෙන් පිලිගත් ට්‍රොට්ස්කිවාදී විශ්ලේෂනය සංශෝධනයට ලක් කිරීමේ වෑයම තුල හා ඒ තුලින් ඇත්ත වශයෙන්ම ට්‍රොට්ස්කිවාදී පක්ෂවල හා සමස්තයක් වශයෙන් හතරවැනි ජාත්‍යන්තරයේ ස්වාධීන පැවැත්මට ඇති ඕනෑම ඓතිහාසික සාධාරනීකරනයක් අහිමි කිරීම තුල ය." (*අප රක්නා උරුමය*, ඩේවිඩ් නෝර්ත් විසිනි, 18වැනි පරිච්ඡේදය: "ජේම්ස් පී. කැනන්ගේ 'විවෘත ලිපිය'")

තෝර්නට්ගේ ලියවිල්ලට එරෙහිව කැනන් ලියමින් සිටියා සේ ය.

දශක පුරා, විශේෂයෙන්, 1968 සහ 1975 වසර අතර යුරෝපය හරහා පැතිරීගිය විප්ලවකාරී රැල්ල සමයේ ස්ටැලින්වාදීන්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්, ධනේශ්වර ජාතිකවාදී තන්ත්‍ර හා ව්‍යාපාර වෙනුවෙන් ක්ෂමාලාපකයින් ලෙස පැබ්ලෝවාදී කන්ඩායම් මුඛ්‍ය භූමිකාවක් ඉටු කලහ. මෙහිදී ඔවුන් ට්‍රොට්ස්කිවාදී වාක්‍ය ඛන්ඩ උපයෝගී කර ගත්තේ කම්කරු නිලධරය අනුගමනය කිරීම ඉදිරියේ පූර්න වශයෙන් දන

නමස්කාර කිරීමේ ප්‍රතිපත්තියක් සාධාරනීකරනය කිරීම පිනිස පමනි.

නිලධාරි පෙලැන්තිය කෙරේ දක්වන මෙම පක්ෂපාතිත්වයට වෛෂයික පදනමක් ඇත. සුලුධනේශවරයේ හා වඩා හොඳ ජීවන තත්වයන්ට හිමිකම් කියන කම්කරු කොටස්වල අවශ්‍යතාවන් පැබ්ලෝවාදීහු නියෝජනය කලහ. මේ ස්තරයේ සමාජ තත්වය රැඳී පැවතියේ රාජ්‍ය සුබසාධන යාන්ත්‍රන හා පශ්චාත් යුද සමයේ ප්‍රදානය කිරීමට ධනේශ්වරයට බලකෙරුනු අනිකුත් සහන මතය.

පාලක පන්තිය එසේ කිරීමට පෙලඹුනේ කම්කරු පන්තිය තුල විප්ලවකාරී වර්ධනයක් ඇති වීමේ බිය හේතු කොට ගෙන ය. එසේ වුවද, මේ වාසි ලබා ගන්නටත් ඒවා පාලනය කිරීමටත් උපයෝගි කරගන්නා ලද මෙවලම් වූයේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ස්ටැලින්වාදී පක්ෂ ය. මේ පක්ෂ මධ්‍යම හා ප්‍රාදේශීය ආන්ඩුවල හා වෘත්තීය සමිති යාන්ත්‍රනයෙහි වරප්‍රසාද ලත් රාජ්‍ය නිලධාරීන්ගේ සැලකිය යුතු ස්තරයකින් ද විශ්වවිද්‍යාලවල හා ඒවාට අනුබද්ධ ආයතනවල අනේකවිධ වමට බර විද්වතුන්ගෙන් ද සමන්විත විය. නොයෙක් වාම රැඩිකල්වාදී කන්ඩායම්වල ප්‍රධාන දේශපාලනමය මූලය වූයේ මෙම වාතාවරනයයි. තමන්ට වාසි සැලසෙන වඩාත් උද්‍යෝගී හා ප්‍රබල ප්‍රතිසංස්කරනයන් ඉල්ලා සිටීමේ දී මේ කන්ඩායම් වෙසෙසියාවක් ඇති කර ගත්හ. තමන් පෝෂනය කල නිලධාරිවාදී හස්තය සපාකන අන්දමෙ ඕනෑම වර්ධනයකට මොවුහු විරුද්ධවූහ.

1990 ගන්නවල ස්ටැලින්වාදී සමාජ ප්‍රජාතන්ත්‍රවාදී හා ධනේශ්වර ජාතිකවාදී පක්ෂවල බිඳ වැටීමට එක්සත් ලේකම් මන්ඩලයේ ප්‍රතිචාරය හැඩගැසුනේ සැලකිල්ලට ගත් එම කරුනු මතම ය. පැබ්ලෝවාදීන් විසින් ඓතිහාසිකව දිගට ම ඉදිරියට ගෙන යන ලද ඉදිරිදර්ශනය එහි ප්‍රබලතම නිශ්ප්‍රභාවීම අත් වින්දේ මෙම දශකය තුල ය.

පැබ්ලෝවාදීන් අනාවැකි පලකරන ලද පරිදි සිදුවූ ස්ටැලින්වාදී නිලධරයේ "ස්වයං ප්‍රතිසංස්කරනය" කෙලවර වූයේ එය ධනේශ්වර කතිපයාධිකාරයක් බවට පරිවර්තනය වීමෙනි. පැරනි සෝවියට් සංගමයෙහි පුද්ගලික දේපල හා වෙලඳපොල සබඳතා යලි ආරම්භ කිරීම අධීක්ෂනය කිරීම මේ කතිපයාධිකාරයේ කාර්යභාරය විය. බටහිර රටවලදී පුද්ගලීකරනය හා සමාජ සුබසාධන විනාශකර දැමීමේ තැචර්වාදී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ යාන්ත්‍රනය ලෙස ප්‍රතිසංස්කරනවාදී කම්කරු පක්ෂ හා වෘත්තීය සමිති යලි හැඩගස්වන ලදී.

සෑම රටකම මේ පැරනි සංවිධානවලට ලැබී තිබුනු සහයෝගය දියවී ගියේ ය. බ්‍රසීලයෙහි ලූලාගේ කම්කරු පක්ෂය හා ඉතාලියේ සැටැලින්වාදීන්ගේ නායකත්වයෙන් යුතු රිෆොන්ඩසියොන් කොමියුනිස්ටාව වැනි නව සංවිධාන ගොඩනැගීමට නිලධාරි පෙලැන්තියේ ඇතැම් කොටස් ගත් උත්සාහයන්ට මේ තත්වය තුඩු දුනි. එය කම්කරු පන්තිය සිය පාලනය යටතේ පවත්වාගෙන යෑමේ උත්සාහයක් විය. එවැනි සෑම උත්සාහයක් ම නව දේශපාලනමය අරුනෝදයක් ලෙස පැබ්ලෝවාදීන් විසින් උනුසුම්ව පිලිගැනුනි.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගෙන් හා ස්ටැලින්වාදීන්ගෙන් ඉතුරු වූ කොටස් සංවිධානාත්මක වශයෙන් එසේ කැඩී යාමට තීරනය කිරීමෙන් පසුව පමනි පැරනි පක්ෂවල දිරාපත්වෙමින් තිබූ මලකුනුවලින් එක්සත් ලෙකම් මන්ඩලයේ කොටස් අවසානයේ දී ඉවත් වූයේ. ඔවුන් එසේ කලේ එම නිලධාරි පෙලැන්තියේම නව දේශපාලන නිර්මාන තුල හැකිතාක් දුරට සුවපහසු අන්දමට රැඳී සිටීම සඳහා පමනි. ඒ සඳහා පූර්න පක්ෂපාතිත්වයේ සලකුනක් ලෙස ඔවුහු ට්‍රොට්ස්කිවාදයට ගැරහීමේ උත්සාහයන් දෙගුන තෙගුන කලහ.

"විප්ලවකාරී මාක්ස්වාදී ව්‍යාපාරයේ ඇතැම් කොටස් සිය වැඩපිලිවෙල් පිලිබඳ උරුමය" අන් සියල්ලන්ගෙන්ම ආරක්ෂා කර ගත යුතු පූජනීය වස්තුවක් ලෙසට උද්දීපනය කිරීම මහා අනතුරක් බව 2003 වසරේදී ඒ අනුව එක්සත් ලේකම් මන්ඩලය අවධාරනය කලේ ය. අවශ්‍ය වන්නේ "ව්‍යාපාරය මත පරපුටුවන්සේ හැසිරෙන හෝ ව්‍යාපාරය යටපත් කරන ප්‍රබුද්ධ, අහංකාර පෙරමුන ගන්නා කන්ඩායමක සංකල්පනය ප්‍රතික්ෂේප කිරීමය."

## මතු සම්බන්ධයි

## සටහන්:

1. "තෙවැනි කාල වකවානුව" තුල, 1928 වසරේ පටන්, සමාජ විප්ලවය අත ලඟයයි කොමියුනිස්ට් ජාත්‍යන්තරය ප්‍රකාශ කලේ ය. ජර්මනියෙහි කොමියුනිස්ට් පක්ෂය අධි-වාම ක්‍රියාමාර්ගයකට අවතීර්න විය. එම පක්ෂය සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් " සමාජ ෆැසිස්ට්වාදීන්" ලෙස හෙලා දැක්කේ ය. ෆැසිස්ට්වාදය පරාජය කිරීමේ උපක්‍රමයක් වශයෙන් හිට්ලර්ට එරෙහිව එක්සත් පෙරමුනක් ගොඩනගන ලෙස ට්‍රොට්ස්කි විසින් කරන ලද ඉල්ලීමට කොමියුනිස්ට් පක්ෂය විරුද්ධ විය. ට්‍රොට්ස්කි එසේ ඉල්ලා සිටියේ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් එලිදරව් කිරීම තුලින් එම ප්‍රතිසංස්කරනවාදීන්ට සහාය දුන් දස ලක්ෂ සංඛ්‍යාත කම්කරු පිරිසකගේ පක්ෂපාතීත්වය කොමියුනිස්ට්වාදය වෙත දිනා ගැනීමේ අරමුන ඇතිවය. හිට්ලර්ගේ ජයග්‍රහනය සහතික කිරීමෙහි ලා කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්ති උපකාරක විය.

2. 1934 වසරේ මිනියපොලිස් මහා වැඩ වර්ජනයට නායකත්වය දෙන ලද්දේ ට්‍රොට්ස්කිවාදීන් විසිනි. එහි ප්‍රතිඵලය වූයේ ඇමරිකානු කම්කරුවන් අතර සමාජවාදය කෙරේ සහාය සැහෙන ප්‍රමානයකින් වර්ධනය වීමකි.

3. දෙවැනි ලෝක සංග්‍රාමයට පසු ආසන්නතම වසර කිහිපය තුල එක්සත් ලේකම් මන්ඩලය දේශපාලන ප්‍රවනතාවක් වශයෙන් ඉස්මතු විය. එවකට හතරවැනි ජාත්‍යන්තරයේ ලේකම් වශයෙන් කටයුතු කල මයිකල් පැබ්ලෝගේ නායකත්වය යටතේ එක්සත් ලේකම් මන්ඩලය ධනවාදයේ ස්ථාවරභාවයට අවස්ථාවාදී අනුගතවීමක් නිරූපනය කලේ ය. මේ ස්ථාවරභාවය පදනම් වූයේ යුරෝපයේ හා වෙනත් තැන්වල ආරම්භක අවස්ථාවෙහි තිබූ විප්ලවකාරී ව්‍යාපාර ස්ටැලින්වාදීන් විසින් දේශපාලනමය වශයෙන් පාවාදීම මත හා යුරෝපීය හා ජපන් ධනවාදය යලි පනගැන්වීමෙහි ලා එක්සත් ජනපදය විසින් ඉටු කරන ලද භූමිකාව මතය.

යෝල්ටාහි දී හා පොට්ස්ඩෑම්හි දී එකග වන ලද පරිදි යුරෝපය කැබලි කිරීම හා ඉන් පසු ඇතිවූ සීතල යුද්ධය විසින් නැගෙනහිර යුරෝපයේ සීමාන්තරික රාජ්‍යයන් තුල අකමැත්තෙන් වුව ද ජනසතු කිරීමේ වැඩ පිලිවෙලක් ක්‍රියාත්මක කිරීමට ස්ටැලින්වාදී නිලධරයට බල කෙරුනි. පැබ්ලෝ මෙයට ප්‍රතිචාරය දැක්වූයේ, සමාජවාදය සාක්ෂාත් කර ගැනීමේ ආයුධය කම්කරු පන්තියම යන කේන්ද්‍රීය අවබෝධය මත පදනම්ව, ස්වාධීන මාක්ස්වාදී පක්ෂ ගොඩනැගීමේ අරගලය ප්‍රතික්ෂේප කිරීමෙනි. ඒ වෙනුවට, ඔහු තර්ක කලේ අධිරාජ්‍යවාදය හා ස්ටැලින්වාදී තන්ත්‍ර අතර ගැටුම විසින් විප්ලවකාරී හැඩගැස්මක් ප්‍රක්ෂේපනය කිරීමට ස්ටැලින්වාදී නිලධාරී පෙලැන්තියට බල කෙරී ඇති බවත් අනාගතයෙහි දී ද එවැන්නක් කිරීමට බලකෙරෙන බවත් ය.

ස්ටැලින්වාදයට යටත් වීම පරිපූර්න ඉදිරිදර්ශනයක් ලෙසට වර්ධනය විය. එය හතරවැනි ජාත්‍යන්තරය දියකර හැරීම සාධාරනීකරනය කලාක් මෙන් ම එසේ දියකරහැරීම සඳහා උනන්දුවෙන් දායක විය. "විකෘති කම්කරු රාජ්‍යයන් සියවස් ගනන් පැවතෙනු ඇතැ"යි යන පැබ්ලෝගේ ආරම්භක අනාවැකිය වෙනුවට නිලධරයේ ක්‍රමානුකූල "ස්වයං-ප්‍රතිසංස්කරනයක්" සිදුවෙමින් පවතින බවට වඩාත් මධ්‍යස්ථ ප්‍රකාශ ආදේශ කෙරින.

තවද, කලින් හතරවැනි ජාත්‍යන්තරය වෙත පැවැරුනු භූමිකාව වෙනුවට ආදේශ කල හැකි " මොට්ට උපකරන" ගනනාවකින් එකක් වූයේ ස්ටැලින්වාදීන් ය. කම්කරු ව්‍යාපාරය තුල සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නිලධරයේ ආධිපත්‍යය පවතින රටවල සමාජවාදී පරිවර්තනයේ යාන්ත්‍රනය එම නිලධාරී පෙලැන්ති වනු ඇත. අවශ්‍යවන්නේ කම්කරු පන්තිය විසින් ඔවුන් මත ඇති තරම් සටන්කාමී පීඩනයක් එල්ල කිරීමක් පමනි. අර්ධ-යටත්විජිත රටවල නොයෙකුත් ධනේශ්වර ජාතිකවාදී තන්ත්‍ර හා පක්ෂ - ලතින් ඇමරිකාවේ පෙරෝන්වාදයේ සිට, පසු කලෙක කියුබාවේ කස්ත්‍රෝවාදය දක්වා - එම භූමිකාව ම ඉටු කරනු ඇත.

© www.wsws.org